The Journal of Archaeology and Heritage Studies (JAHS) 9 (I) 2022: 13-22 pp

JAHS

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES
Journal Home page http://fssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# මහනුවර අවධියේ වෙල්ලස්සේ විහාර සිතුවම්වලින් අනාවරණය වන තත්කාලීන සමාජ ආර්ථික පසුබිම පිළිබඳ විමර්ශනයක්

අර්ජුන තන්තිලගේ[1], ප්‍රසන්න රණබාහු[2], ඉන්දික විතානගේ[*3], ෂ්‍යාමල් ඉරෝෂණ[4], ජයම්පත් සේනානායක[5]

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැළණිය විශ්වවිද්‍යාලය, 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැළණිය විශ්වවිද්‍යාලය, 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.
3. විද්‍යාගාර සහායක, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැළණිය විශ්වවිද්‍යාලය, 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. (*Corresponding Author) indikapgiar@gmail.com
4. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැළණිය විශ්වවිද්‍යාලය, 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.
5. විද්‍යාගාර සහායක, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැළණිය විශ්වවිද්‍යාලය, 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.

**සංක්ෂිප්තය**

මෙම ලේඛනය මගින් සාකච්ඡාවට බඳුන් කරනු ලබන්නේ මහනුවර අවධියට අයත් වන වෙල්ලස්ස ප්‍රදේශයේ විහාර බිතුසිතුවම්වල තාක්ෂණික සහ කලා ප්‍රයෝගමය විෂමතාවත් ඊට හේතුපාදක වූ සමාජ ආර්ථික දේශපාලන පසුබිමත් ය. ඒ සඳහා පැරණි වෙල්ලස්ස ප්‍රදේශය ඇතුළත් වර්තමාන මොණරාගල දිස්ත්‍රික්කය නියෝජනය වන පරිදි මහනුවර යුගයේ බිතු සිතුවම් සහිත විහාරස්ථාන දොළහක් පමණ මෙහි දී අධ්‍යයනයට බඳුන් කළ අතර ඉන් ස්ථාන හතරකින් වර්ණක නියැදි ලබාගන්නා ලදී. එකී බිතුසිතුවම්වල තාක්ෂණික භාවිතය හඳුනාගනු පිණිස රසායනික විශ්ලේෂණ, අන්වීක්ෂීය විශ්ලේෂණ, අධෝරක්රක්ත වර්ණාවලී විශ්ලේෂණ යන විද්‍යාගාර ක්‍රමවේද යොදාගන්නා ලදී. කලා ඉතිහාසමය අධ්‍යයනවල දී ආකෘතිවාදය හා රූපාර්ථවේදය යන අධ්‍යයන ක්‍රම භාවිත කරන ලදී. එකී අධ්‍යයනයන්ට අනුව වෙල්ලස්ස ප්‍රදේශයට අයත් මහනුවර යුගයේ බිතුසිතුවම්වල තාක්ෂණික හා කලා ඉතිහාසමය ලක්ෂණයන් සමකාලීනව දිවයිනේ අන් ප්‍රදේශවලට වඩා වෙනස් තත්ත්වයක් පෙන්නුම්කරන බව පෙනී ගියේ ය. ඒ සඳහා වෙල්ලස්ස ප්‍රදේශයේ පැවති සමාජ ආර්ථික තත්ත්වයන්ගේ සුවිශේෂිතාව බලපාන්නට ඇතැයි මෙහිදී යෝජනාකරනු ලැබේ.

ARTICLE INFO

*Article history:*
Received 15 June 2023
Accepted 29 September 2023
Available online 29 December 2023

මුඛ්‍ය පද: වෙල්ලස්ස, මහනුවර යුගයේ බිතුසිතුවම්, වර්ණක විශ්ලේෂණය, කලා ඉතිහාසය, සමාජ තත්ත්වය

## 1. හැඳින්වීම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේෂණ විද්‍යාගාරය විසින් ශ්‍රී ලංකාවේ පැරණි විහාර සිතුවම්වල භාවිත වර්ණකයන්ගේ කාල අවකාශීය විෂමතාවන් පිළිබඳව පසුගිය කාලවකවානුවේ අධ්‍යයනයක් සිදුකරනු ලැබිණ. මහනුවර යුගයේ සිතුවම් කලාවේ ගැනෙන වර්ණකයන් කාල අවධීන් තුනකදී එකිනෙකට වෙනස්වන බවත්, එකී වෙනස විවිධ අවකාශීය ප්‍රදේශවල විවිධාකාරවන බවත් එහිදී හඳුනා ගන්නා ලදී. මෙම අවකාශීය විවිධත්වය මහනුවර රාජධානියේ පැරණි භූගෝලීය ප්‍රදේශයන් වූ සත්කෝරළය, සබරගමුව, මාතලේ හා වෙල්ලස්ස යන ඒකකයන්හි දී කැපීපෙනෙන ලෙස එකිනෙකින් වෙනස්වන බව ද පෙනී ගිය කාරණයකි. වර්ණක භාවිතය පිළිබඳව විෂමතාවයන් මෙම අධ්‍යයනය තුළ දී පරාමිතිය සේ අධ්‍යයනය කරනු ලැබූව ද එකිනෙකින් වෙනස් වන්නාවූ භූ අවකාශයන් සලකා බලන කල ඒවායේ සිත්තර සම්ප්‍රදායන් මෙන් ම එකී අවකාශයන්ගේ ඓතිහාසික සමාජ ආර්ථික තත්වයන් ද එකිනෙකින් සියුම් ලෙස වෙනස් වූ බව පසුව පෙනී ගියේ ය. එකී අධ්‍යයනයේ ප්‍රතිඵල පාදක කරගනිමින් මහනුවර රාජධානියේ පැරණි දිසාවනියක් වූ වෙල්ලස්ස ආශ්‍රිත ප්‍රදේශයේ විහාර සිතුවම්වල භාවිත වර්ණක, ඒවායේ කාලානුක්‍රමික වෙනස්වීම හා ඊට පසුබිම් වූ



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

තත්කාලීන සමාජ ආර්ථික තත්ත්වයන් විග්‍රහකර ගැනීම මෙම ලේඛනයේ අරමුණ වෙයි.

## 2. ක්‍රමවේදය

වෙල්ලස්ස කලාපය තුළ පවතින පැරණි ආගමික සම්ප්‍රදාය අනුව එකී කලාපයේ මහනුවර අවධියට ගැනෙන පැරණිතම විහාරස්ථාන වනුයේ කොකුන්නෑව විහාරය හා කොටසර පියංගල විහාරය යි. එකී විහාරස්ථාන ගොඩනැංවුණු කාලයට පසුව හා ඊට ආසන්න අවධියකදී මොණරාගල මයුරගිරි විහාරය, මුප්පනේ විහාරය, තිඹිරිය විහාරය ගොඩනංවා තිබේ. මීට ආසන්න හෝ සමාන කාලපරිච්ඡේදයක කටුගහගල්ගේ, යුධගනාව විහාරය, බුද්ධම විහාරය, කවුඩාව විහාරය, ගණේඋල්පත විහාරය, කොටියාගල විහාරය, මුදලින්දාරාමය වැනි විහාර ගොඩ නැංවූ බව පිළිගැනෙයි. මෙම විහාරයන් හා සමකාලීන වෙතැයි දැනගන්නට ලැබුණු අන් විහාරස්ථානවලට වඩා මෙකී විහාරයන්හි සිතුවම් අධ්‍යයනය කළ හැකි මට්ටමින් ඉතිරිව තිබූ බැවින් අධ්‍යයනය සඳහා ඉහත විහාරස්ථානයන්හි සිතුවම් පාදක කර ගන්නා ලදී. සිතුවම් අධ්‍යනය කරනු ලැබූ සෑම විහාරස්ථානයකින් ම විශ්ලේෂණය සඳහා වර්ණක නියැදි ලබා ගත නොහැකි විය. ස්වභාවිකව ගැලවී වැටීමට ආසන්න තත්ත්වයේ වූ, සංරක්ෂණයේදී වෙන ම පිරවිය යුතු මට්ටමේ පැවති ස්ථානවලින් පමණක් ඉතා කුඩා නියැදි ලබා ගන්නා ලදී.

## 3. ප්‍රතිඵල

වගුව 1. වර්ණක විශ්ලේෂණයන්ගේ පතිඵල

| විහාරස්ථානය | රතු වර්ණය | කහ වර්ණය | නිල් වර්ණය |
|---|---|---|---|
| කොටසර-පියංගල ඇතුළත ස්තරය | සාදිලිංගම් | ගොකටු | - |
| කොටසර-පියංගල පිටත ස්තරය | සාදිලිංගම් | ඔපිමන්ට් | ප්‍රසියන් නිල |
| තිඹිරිය විහාරය | සාදිලිංගම් | ඔපිමන්ට් | ප්‍රසියන් නිල |
| මයුරගිරි විහාරය | සාදිලිංගම් | ඔපිමන්ට් | ප්‍රසියන් නිල |
| මුප්පනේ විහාරය | සාදිලිංගම් | ඔපිමන්ට් | ප්‍රසියන් නිල |

නියැදි අධ්‍යයනයට බඳුන් කරනු ලැබූ විහාරස්ථාන හැම එකක් ම පාහේ කිහිප අවස්ථාවකදී ම ප්‍රතිසංස්කරණවලට ලක් වී ඇත. එම නිසා ආරම්භක අවස්ථාවේ දී යොදාගත් වර්ණක හඳුනා ගැනීමේ අවස්ථාව විරල ය. නමුත් ඒ සඳහා කොටසර - පියංගල විහාරස්ථානයේ වඩාත් ම ඇතුළතින් පිහිටි ආරම්භක අවස්ථාවේ ස්ථරය නිරාවරණය වූ කොටසකින් නියැදි ලබාගත හැකි විය. කොටසර - පියංගල විහාරස්ථානය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවධියේ සිදු වූ ආගමික ප්‍රබෝධය සමඟ සිතුවම් අඳිනු ලැබූ ස්ථානයකි.

මීට ඉහත අධ්‍යයනයන්වල දී පෙනී ගොස් ඇත්තේ උක්ත ශාසනික ප්‍රභෝධය සමග ප්‍රචලිත වූ සිතුවම්කරණයට යොදා ගත් වර්ණක වූයේ සාදිලිංගම් සහ ගොකටු බව යි (තන්තිලගේ ඇතුළු පිරිස 2022). කොටසර පියංගල විහාරස්ථානය ද සාදිලිංගම් සහ ගොකටු වර්ණක මුල් අවස්ථාවේ යොදාගෙන ඇත. මේ අනුව පැහැදිලි වන්නේ උක්ත ආගමික ප්‍රබෝධය සමග වෙල්ලස්ස ප්‍රදේශය ද සම්බන්ධව ඇති බව යි. අපගේ වර්ණක විශ්ලේෂණයෙන් ඒ බව තවදුරටත් පැහැදිලි විය (වගුව 1).

නමුත් කොටසර-පියංගල විහාරයේ පසු අවස්ථාවක ප්‍රතිසංස්කරණයට ලක් ව මතුපිටට නිරාවරිත සිතුවම් පෘෂ්ඨයේ වර්ණක ලෙස හඳුනාගත හැක්කේ සාදිලිංගම් සහ ඔපිමන්ට් ය. මීට අමතරව නිල් වර්ණකය සඳහා ප්‍රසියන් නිල ස්වල්ප වශයෙන් යොදාගෙන තිබේ (වගුවඃ 1). මීට ඉහත අධ්‍යයනයන්වල දී පෙනී ගොස් ඇති පරිදි මෙම වර්ණක මහනුවර සිතුවම් සම්ප්‍රදාය තුළ භාවිතව ඇත්තේ 1820-1850 කාලයේ ය (තන්තිලගේ ඇතුළු පිරිස 2018, 2022). එබැවින් වෙල්ලස්සේ විහාරස්ථාන එම කාල පරිච්ඡේදයේ දී ම (1820-1850) ප්‍රතිසංස්කරණයට ලක්වූ බව කිව හැකිය.

මීට ඉහත අධ්‍යයනයන්වල දී පෙනී ගොස් ඇත්තේ සබරගමුව, සත්කෝරළය සහ දකුණ බස්නාහිර පළාත් අවට විහාරස්ථානයන් 1880-1910 කාලපරිච්ඡේදය තුළ දී වෙනත් වර්ණක කට්ටලයක් භාවිතකර ඇති බව යි (තන්තිලගේ ඇතුළු පිරිස 2018, 2022). එම වර්ණක නම් ලෙඩ් ඔක්සයිඩ් සහ ලෙඩ් ක්‍රෝමේට් ය. එමෙන් ම එකී සිතුවම් ඊට පෙර පැවති මහනුවර සිතුවම්වලට වඩා මුළුමනින් ම වෙනස් කලාත්මක ප්‍රයෝගයන් අනුගමනය කරනු ලැබ තිබීම ද හඳුනා ගත හැකි විය. නමුත් වෙල්ලස්ස ප්‍රදේශයේ අධ්‍යයනයට බඳුන් කරනු ලැබූ විහාරස්ථාන කිසිවක එකී වර්ණක හෝ ශෛලිය සහිත සිතුවම් හඳුනාගත නොහැකි විය. මීට සමීප ශෛලියක් අනුගමනය කරනු ලැබ ඇත්තේ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වර්තමානයේ දී මොණරාගල දිස්ත්‍රික්කයට අයත් වැල්ලවායේ රක්බිත්තා කන්ද විහාරස්ථානයේ පමණි. නමුත් අතීතයේ පහළ ඌවට අයත්ව තිබූ මෙම විහාරස්ථානය සඳහා සබරගමුවේ බලපෑම් ද ලැබී ඇති අතර ඓතිහාසිකව එය වෙල්ලස්ස කලාපයට අයත් වූවක් නොවේ.

වෙල්ලස්ස ප්‍රදේශයේ විහාරස්ථාන 1880 - 1910 කාලයේ දී ප්‍රතිසංස්කරණය ලක් වූ අවස්ථා වාර්තා වී තිබේ (මහින්ද හිමි, 2018: 31-66). නමුත් එකී අවස්ථාවේ දී සබරගමුව, සත් කෝරළය, දකුණ හා බස්නාහිර ප්‍රදේශවල දී මෙන් සිතුවම් ශෛලීය වෙනස් කිරීමට හෝ ලෙඩ් වර්ණක වර්ග භාවිතයට වෙල්ලස්ස සිත්තරුන් පෙළඹී නොමැත.





ඡායාරූපය 1. සිය ප්‍රදේශවල විහාරස්ථාන ප්‍රතිසංස්කරණට මූලිකත්වය ගනුලැබු කැරැල්ලෙන් පසු තනතුරු දැරූ ආණ්ඩුවේ නව සිංහල නිලධාරීන් - තිබ්රිය විහාරය (වම) ඡායාරූපය 2. සිය ප්‍රදේශවල විහාරස්ථාන ප්‍රතිසංස්කරණට මූලිකත්වය ගනුලැබු කැරැල්ලෙන් පසු තනතුරු දැරූ ආණ්ඩුවේ නව සිංහල නිලධාරීන් - මයුරගිරි විහාරය (දකුණ)

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවධියේදී මහනුවර රාජධානියේ පොදු වර්ණක කට්ටලය (සාදිලිංගම් සහ ගොකටු) භාවිත කරනු ලැබූ වෙල්ලස්ස සිත්තරුන් බ්‍රිතාන්‍ය අවධියේ මුල් කොටසේදී (1820 - 1850) අන් ප්‍රදේශමෙන්ම අදාළ විපරිනාමීය තත්වයන් සමග අනුගතව ඇත. නමුත් ඉන්පසුව උඩරට රාජධානිය යටතේ පැවති (සබරගමුව, සත්කෝරළය සහ දකුණ බස්නාහිර) ප්‍රදේශවල පොදු සංචලතාවන්ගෙන් මෙම කලාපය වියුක්ත වූ බවක් සිතුවම් වර්ණකවලින් පෙනී යයි. වරණකවලින් පෙන්වන මෙම පොදු සංචලතාව කලා ඉතිහාසමය වශයෙන් ද නිරීක්ෂණය විය. ඒ පිළිබඳ පහත සාකච්ඡාවේ දී තවදුරටත් අවධානය යොමු කරනු ලැබේ.

## 4. සාකච්ඡාව

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවදියේදී මහනුවර මධ්‍යරාජ්‍යයේ අනුග්‍රහය සහිතව වෙල්ලස්සේ ඇති වූ සාසනික ප්‍රබෝධයේදී ඇඳි සිතුවම් වර්තමානයේදී මුල් ආකාරවලින් ම දැක ගැනීමට ඇති හැකියාව අවම ය. සියවස් දෙකකටත් වැඩි කාලාන්තරයකදී ඒවා නොයෙක්වර ප්‍රතිසංස්කරණයන්ට ලක්ව ඇති හෙයින් විහාර සිතුවම්වල වර්තමාන තත්ත්වය දීර්ඝ විපරිණාමයක ප්‍රතිඵලයකි. වෙල්ලස්සේ විහාර සිතුවම්කරනය සඳහා මහනුවර මධ්‍ය රාජ්‍යයේ සිතුවම් ශිල්පීන් පැමිණියේ ද යන්න කිසිදු ස්ථානයක වාර්තා වී නැත. දෙවරගම්පොල සිල්වත්තැන හෝ නිලගම සිත්තර නයිදේ ඇතුළු මහනුවර සුප්‍රකට ශිල්පීන්ගේ කටයුතු අතරට වෙල්ලස්ස සමග සබැඳියාවක් කිසිවිටෙක වාර්තාවන්නේ නැත. නමුත් මහනුවර මල්වතු විහාරය සමග සෘජු සම්බන්ධතා පවත්වනුලැබූ වෙල්ලස්ස සංඝ පරම්පරාව සිය කටයුතු සකස්කර ගැනීමෙහිලා මහනුවර මධ්‍ය කේන්ද්‍රය පරමාදර්ශයක් ලෙසින් සැලකූ බවට කොතෙකුත් නිදර්ශනයන් ඇත. ඔවුන් උපසම්පදාව සඳහා මහනුවරට වැඩමකළ අතර ධාතු කරඬුව, ධර්ම ග්‍රන්ථ වැනි ආගමික ගෞරවයට පාත්‍රවන්නා වූ දෑ රැගෙන ආවේ ද මහනුවරිනි (සුමනසාර හිමි, 2018:286-309). එමෙන් ම ඔවුන්ගේ විහාර සිතුවම් සඳහා යොදාගත් වර්ණක ද මධ්‍ය මහනුවර සිතුවම් සම්ප්‍රදායේ වර්ණක ම බව පෙනී යයි. එබැවින් වෙල්ලස්ස කලාපය තුළ මහනුවර අවධියේ විහාරස්ථාන ආරම්භවන විට (1720 - 1760) මධ්‍ය මහනුවර සිතුවම් සම්ප්‍රදාය ඒ වෙත ලැබෙන්නට ඇත.

පසුකාලීනව වෙල්ලස්සේ ප්‍රභුවරුන්ගේ අනුග්‍රහය සහිතව සිදුවූ ප්‍රතිසංස්කරණවල දී (ඡායාරූපය 1, 2) එකී කටයුතුවල ශිල්පීන් වශයෙන් යෙදෙන්නට ඇත්තේ ප්‍රාදේශීය සිතුවම් ශිල්පීන් විය යුතු ය. කොකුන්නෑව, කොටසර පියංගල වැනි වෙල්ලස්ස කලාපයේ විහාර සිතුවම් නිරීක්ෂණය කරනු ලැබූ සිරි ගුණසිංහගේ අදහස වන්නේ එකී සිතුවම්වල ඉස්මතුවන ශෛලීය ලක්ෂණ ප්‍රාදේශීය සිත්තරුන් කණ්ඩායමකගේ කටයුතු නිසා ඇතිවූ ප්‍රාදේශීය ශෛලියක් වශයෙනි. එම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සිත්තරුන් මහනුවර මධ්‍ය කේන්ද්‍රයේ අදහස්වලට ඍජුව විවර නොවූ, දැඩි පුහුණුවක් නොලත්, අඩු ශිල්පීය දැනුමකින් යුත් ග්‍රාමීය මට්ටමේ සිත්තරුන් වන්නට ඇතැයි සිරි ගුණසිංහ අදහස් කරයි (Gunasinghe 1978). කොටසර පියංගල විහාරයේ රහත් රූප හා බුද්ධ රූපය අතර පරිමාණීය වෙනස පෙන්වා දෙන ඔහු බුදුරජාණන් වහන්සේගේ රූපය සාපේක්ෂව ඉතා විශාලවත්, මුගලන් හිමියන් මධ්‍ය ප්‍රමාණයෙනුත් රහත් රූප ඉතා කුඩාවටත් ඇඳීම අවධානයට ලක්කරයි. මෙම සිතුවම්කරණයට සම්බන්ධ පුද්ගලයන්ගේ බොදු බැතිය ඉන් නිරූපණයවන මුත්, එය මහනුවර සම්ප්‍රදාය අනුදත් පරිමාණයන්ට අනුකූල නොවන බවගුණසිංහයන් විසින් පෙන්වාදී ඇත (ඡායාරූපය 3) (Gunasinghe 1978). එක ම ඵලකය තුළ පරිමාණය පිළිබඳව සැලකිලිමත් නොවී රූපය මගින් ලබාදෙන සංඥාව තීව්‍ර කිරීම සඳහා වෙල්ලස්සේ සිත්තරුන් දක්වන රුචිකත්වය ගුණසිංහ විසින් කොකුන්නෑව විහාරයේ පැති බිත්තියේ ඇති භික්ෂු රූපය හා ගිහි රූපය මගින් ද පෙන්වා දෙයි. බුදු පුදට යන භික්ෂුවක් සහ අතවැසියා මින් නිරූපිත ය. එක පෙළක සිටින මුත් භික්ෂුව අතවැසියාට දෙගුණයකටත් වඩා විශාලත්වයක් පෙන්වීම මෙහිදී දැකිය හැකි ය. නමුත් ප්‍රතිවිරුද්ධ බිත්තියේ ඇඳ ඇති ගිහි ප්‍රභූවරුන් දෙදෙනා සමාන තරාතිරම්වල පුද්ගලයන් බව ඇඳුම්වලින් පෙනී යන අතර, ඔවුන් ශරීර ප්‍රමාණයෙන් සහමුලින් ම එක සමානව ඇඳ තිබේ. කොකුන්නෑව විහාරස්ථානයේ පසුකාලීන ප්‍රතිසංස්කරණවල දී එක් වූ සිතුවම් මහනුවර සම්ප්‍රදායේ අවම කලා භාවිතාවන් පවා උල්ලංඝනය කර ඇතැයි අදහස් කරන ගුණසිංහ, එහි මුල්කාලීන කැටයම් නිරීක්ෂණය කරමින් ඒවාහි ශිල්පීය පුහුණුව වඩා ඉහළ යැයි අදහස් දක්වා තිබේ (Gunasinghe 1978).

වෙල්ලස්ස කලාපය මහනුවර සම්ප්‍රදායික සිතුවම්වලින් වෙනස් වන ආකාරය පෙන්වා දෙන ගුණසිංහ බුද්දම විහාරයේ සැරසිලි ද ඒ සඳහා උදාහරණ කොට ගනී. විශේෂයෙන් ම බුද්දම විහාර වියන් සිතුවමේ සැරසිලි රූප මධ්‍ය මහනුවර සම්ප්‍රදායේ දැකිය නොහැකි ඒවා බව ඔහුගේ අදහස යි. එහි ලියවැල් රටාව ගුණසිංහගේ විශේෂ අවධානයට ලක්වෙයි. තියුණු නොවූ රිද්මයක් සහිත ඛණ්ඩිත රේඛාවලින් ඇඳ ඇති ලියවැල් මෝස්තරය, මහනුවර ලියවැල සඳහා පුහුණුවක් නොලැබූ සිත්තරකු විසින් මහනුවර ලියවැලේ රූපාකාරය අනුකරණය කිරීමට දැක්වූ දුර්වල උත්සාහයක් ලෙස ගුණසිංහ විස්තර කරයි (Gunasinghe 1978). කෙසේ නමුත් ඛණ්ඩිත, රිද්මයක් රහිත රේඛාවන්ගෙන් ඇඳුණු ලියවැල අවස්ථා කිහිපයකදී ම වෙල්ලස්ස කලාපය තුළ දැකිය හැකි ය. විශේෂයෙන් ම කටුගහගල්ගේ ලියවැල් සිතුවමේ රේඛාවක ඝණකම මීට උදාහරණ ලෙස ඉදිරිපත් කළ හැකි ය. මහනුවර සම්ප්‍රදායේ දැකිය හැකි තියුණු රේඛාව වෙනුවට කටුගහගල්ගේ ලියවැලේ රේඛාවක් සෙන්ටි මීටර් 1 - 1.5 පමණ ඝණකමකින් ඛණ්ඩිතව හා රිද්මයක් රහිතව ඇඳ තිබෙනු දැකිය හැකි ය (ඡායාරූපය 1).

වස්තු විෂය අතින් සැලකීමේදී මහනුවර සම්ප්‍රදායේ සම්ප්‍රදායික වස්තූන් වූ සූවිසි විවරණය, රහත් රූප, සත්සතිය වැනි සිතුවම් වෙල්ලස්සේදී ද බහුල ය. එහෙත් ඇතැම් විහාරස්ථානවල පිටත බිත්තියේ ඇඳ ඇති අපාය රූප පසුකාලීනව එක් කෙරී ඇති අතර, ඒවායේ දකුණු සිත්තර සම්ප්‍රදායේ බලපෑම දැකිය හැකි ය. වෙල්ලස්ස සිතුවම් අතර ගැනෙන ගණදෙවියන්ගේ හිටි රූපය, පියාපත් සහිත කින්නර රූප, මල් වැල් සහිත කිඹිහි මූණ කලාපයට ආවේණික ප්‍රාදේශීය ලක්ෂණ විශද කරයි.

වෙල්ලස්සේ සිතුවම් ද මහනුවර සම්ප්‍රදායේ සිතුවම් මෙන් ම රතු, කළු, කහ වර්ණයන් මූලික කොට ගනී. නමුත් පසුකාලීනව ප්‍රතිසංස්කරණයට ලක් වූ ස්ථානවල නිල් පැහැය බහුලව යොදාගනු දැකිය හැකි ය. තිඹිරිය, මුප්පනේ, මයුරගිරිය වැනි ස්ථාන වල මෙලෙස නිල් පැහැය එක්කිරීම බහුලව දැකිය හැකිය. දිවයිනේ අන් ප්‍රදේශවල 1880 - 1910 වැනි කාල සීමාවක පැතිර ගිය සංක්‍රාන්ති සිත්තර ශෛලිය වෙල්ලස්සට බලපෑම් කළ බවක් හඳුනාගත නොහැකි වුව ද (ඡායාරූපය 6, 7, 8,9) පැවැති පැරණි සිතුවම්වලට නිල් පැහැය එක්කිරීම උක්ත කාල සීමාවේ දී සිදු වූ බවට අනුමාන කළ හැකි සාක්ෂි පවතී. තීව්‍ර නොවූ පුළුල් රේඛා සහිත සිතුවම් ද එම අවධියේ සිදු වූ ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් සේ හඳුනාගත හැකි ය. එකී ප්‍රතිසංස්කරණවලට භාජනය නොවී දැඩි සේ හායනයට ලක් වූ බඩල්කුඹුර මුදලින්දාරාමයේ ඉතිරි සිතුවම් කොටස්වල නිල් පැහැය හෝ පුළුල් කැඩි රේඛා සහිත සිතුවම් දක්නට නොවීම මේ සඳහා පෙන්වා දිය හැකි කදිම නිදර්ශනයකි.

## 4.1. වෙල්ලස්ස ප්‍රාදේශීය සිතුවම් සඳහා බලපෑ සමාජ ආර්ථික පසුබිම

මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවදියේ සිදුවූ ශාසන සංශෝධනයේදී හා බෞද්ධාගමික ප්‍රබෝධයේ දී ඊට පාදක වූ මුඛ්‍ය කලාපයක් ලෙස වෙල්ලස්ස දිසාවනිය හඳුනාගත හැකි ය (සුමනසාර හිමි, 2018: 286-309). උක්ත සාසනික ප්‍රබෝදයේ දී වැලිවිට සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා රාජකීය අනුග්‍රහය සහිතව මහනුවර රාජධානියේ විවිධ ප්‍රදේශ කරා වැඩමවා ශාසනික ප්‍රබෝධයකට මග පෑදූ බව නොයෙකුත් මූලාශ්‍රවල සඳහන් වේ. තුන් කෝරළය, හතර කෝරළය, සත් කෝරළය, සබරගමුව යන මහනුවර කේන්ද්‍රීය පස්රට වටා පිහිටි දිසාවනීන් මේ අතුරින් ප්‍රධාන කොට ගත්ත ද, සියම් උපසම්පදාව ලත් භික්ෂූන් ඒ ආකාරයෙන් ම වෙල්ලස්සට ද වැඩම කරනු ලැබූ බව වෙල්ලස්ස භික්ෂු පරම්පරාවේ සාධක අනුව පෙනී යයි. එකී භික්ෂූන් වහන්සේලා මහනුවර ශාසනික ප්‍රබෝධය ගුරුකොට ගනිමින් වෙල්ලස්ස පුරා විවිධ ස්ථානවල මහනුවර සම්ප්‍රදායේ සිතුවම් සහිත විහාරස්ථාන ගොඩ නංවන ලදී (සුමනසාර හිමි, 2018:286-309).

මෙවැනි ශාසනික ප්‍රබෝධයක් ඇති වීම සඳහා ඊට ම ආවේණික සමාජ ආර්ථික වැදගත්කමක් වෙල්ලස්ස කලාපය අරභයා මහනුවර රජවරුන්ට පැවතිණි. මහනුවර රාජධානිය රටේ නැගෙනහිර හා ගිනිකොණ දිග මුහුදුබඩ ප්‍රදේශ සමග සම්බන්ධ කරනු ලැබූ මාර්ග පද්ධතියෙන් වැදගත් කොටසක් වෙල්ලස්ස හරහා වැටීතිබිණි (සමීරප්‍රසංග, 2018: 701-715). උඩරට රාජධානිය සිය වැදගත් සාමන්ත වසමක් ලෙස සැලකූ පානම ප්‍රදේශයට ගමන් ගත් මාර්ගය සියඹලාණ්ඩුව හරහා ද, දීඝවාපිය ද සහිත සමන්තුරේ, කල්මුණේ ප්‍රදේශ වෙත වැටුණු මාර්ගය බිබිල හරහා ද, හම්බන්තොටට ගමන් කල මාර්ගය නක්කල හා බුත්තල හරහා ද වැටී තිබිණි. දීඝවාපී ප්‍රදේශයේ සහල්, කල්මුණේ ප්‍රදේශයේ කරවල සහ මුස්ලිම් වෙළඳුන් මාර්ගයෙන් ලැබුණු රෙදිපිළිවලටත් වඩා මෙම මාර්ග පද්ධතිය උඩරටට වැදගත්වූයේ හම්බන්තොටින් ගෙනයනු ලැබූ ලුණු නිසා  ය. හම්බන්තොට ලුණු උඩරටට ලබා ගැනීම සඳහා මෙකී මාර්ගය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් උඩරට රජවරු පෘතුගීසි අවදියේ පටන් ම ඉමහත් පරිශ්‍රමයක් දරා ඇත.



ඡායාරූපය 3. කොටසර-පියංගල විහාරයේ පැති බිත්තියේ ඇති භික්ෂු රූපය හා ගිහි රූපය

වෙල්ලස්සේ භික්ෂූන් වහන්සේලා මධ්‍ය රාජධානියේ ප්‍රධාන විහාරස්ථාන සමග ධූරාවලි ගත සම්බන්ධතාවයක් දක්වනු ලැබිණ. ඔවුන්ගේ සම්බන්ධතාව එතරම් දුර එකක් නොවූව ද වෙල්ලස්සේ රාජකාරි සංවිධානය මෙන්ම සංඝ සමාජය ද ඊට අනන්‍ය ආවේණික තත්වයක් දැරී ය. වෙල්ලස්සේ භික්ෂූන් අවශ්‍යතා සඳහා අගනුවරට වැඩ කළ විට නවාතැන් ගැනීම සඳහා මල්වතු පාර්ශ්වයේ ප්‍රධාන විහාරස්ථානය තුළ වෙල්ලස්ස පන්සල නම් වෙන ම ස්ථානයක් විය. බොහෝ කලක් යනතුරු එකී විහාරය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

භාරව වෙල්ලස්සේ හිමිනමක් කටයුතු කරන ලදී (සුමනසාර හිමි, 2018: 286-309). අස්ගිරි පාර්ශවය සතු පන්සල් කිහිපයක් ද වෙල්ලස්ස දිසාවනිය තුළ පැවතිණි. වෙල්ලස්සේ අස්ගිරි භික්ෂූන්ද සිය අගනගර මූලස්ථානය සමග සමීප සම්බන්ධයක් පැවැත්වූ බව පෙනී යයි.



ඡායාරූපය 4. කටුගහගල්ගේ විහාරයේ තියුණු නොවූ රිද්මයක් සහිත බන්ධිත රේඛාවලින් ඇඳ ඇති ලියවැල් මෝස්තරය


මෙම තත්වය නිසාවෙන් වෙල්ලස්ස කලාපය මහනුවර රජවරුන්ගේ පාලනය යටතේ කිසිලෙසකින් හුදකලා ප්‍රදේශයක් වූවේ නැත. නොයෙකුත් රාජකාරි සම්බන්ධතා හරහා, ප්‍රවාහන සම්බන්ධතා මෙන්ම ආගමික සම්බන්ධතා හරහා ද වෙල්ලස්ස මහනුවර රාජධානියේ වැදගත් දිසාවනියක් ලෙස සැලකිණි. එබැවින් මහනුවර රාජධානියේ සිදුවූ මතවාදී ප්‍රවාහයන්ගේ නොනිත් බලපෑමෙන් වෙල්ලස්ස මිදුනේ නැත. සියම් උපසම්පදාව ගෙන ඒම, මල්වතු විහාර පාර්ශ්වයේ ආරම්භය, වැලිවිට සරණංකර හිමියන්ගේ මූලිකත්වයෙන් සිදුවූ ආගමික ප්‍රබෝධය යටතේ නව විහාර ඉදිවීම හා විහාර සිතුවම්කරණය ඇතිවීම යන කරුණු සියල්ල වෙල්ලස්සට ද ඒ අයුරින් ම බලපාන ලදී.

## 4.2. බ්‍රිතාන්‍ය පාලනය මුල් අවධියේ වෙල්ලස්ස

වෙල්ලස්සේ වැසියන් බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධ කැරැල්ලෙන් ඉවත්ව ඉංග්‍රීසි ආණ්ඩුවට පක්ෂපාතීත්වය ප්‍රකාශ කිරීමත් සමග ම එහි සිවිල් පරිපාලනය ස්ථාපිත කිරීමට ආණ්ඩුව උත්සුක විය. කැරැල්ලේදී ඉවත් කළ, ජීවිතක්ෂයට පත්කළ, හිරභාරයට ගනු ලැබූ තනතුරු දරුවන්ගෙන් හිස් වූ සියලු තනතුරු සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් නැවත පත්කරනු ලැබුවේ වෙල්ලස්සේ ප්‍රභූ පවුල් වලිනි. ඒ තනතුරු සඳහා කිසිදු පැකිලීමකින් තොරව වෙල්ලස්ස ප්‍රභූ කණ්ඩායම් ඉදිරිපත්ව තිබේ (විමලානන්ද, 2019). විහාරස්ථානවල පුරප්පාඩු වූ නායක පදවි චාරිත්‍රානුකූලව හිමිවිය යුතු ඊළඟ හිමිවරුන්ට ලබා දෙන ලදී. කැරැල්ලේ භික්ෂු නායකත්වය ලබාදුන් පොතුබන්දන විහාරයේ නාපේ රේවත හිමියන් අත්අඩංගුවට ගත්තෙන් එම විහාරයේ නීත්‍යානුකූල නායකත්වය දැරූ ස්වාමීන් වහන්සේ කැරැල්ල අවසන් වූ වහා නැවත පොතුබන්දන විහාරයට වැඩම කොට ශාසනික කටයුතු ආරම්භ කරන ලදී (ජිනරතන හිමි, 2018: 782-786). බ්‍රිතාන්‍ය පරිපාලනය යටතේ කැරැල්ලේ හානිය මැකී යන සේ ප්‍රදේශය යාවත්කාලීන කිරීමට උත්සාහ දරණු ලැබුවේ ප්‍රදේශයෙන් ලැබිය හැකි ආර්ථික වාසි කෙරෙහි ද සැලකිලිමත් වෙමිනි. මෙම ප්‍රදේශවල ගොවිතැන් වහා ම ඇරඹීම සඳහා බිත්තර වී පවා නොමිලයේ බෙදා හැරීමට පරිපාලනය කටයුතු කරන ලදී (විමලානන්ද 2019). එවැනි කටයුතු සඳහා කෝරාළ, අතුකෝරාළ, ආරච්චි වැනි තනතුරු දැරූ ආණ්ඩුවේ නව සිංහල නිලධාරීන් පෙරමුණ ගත් අතර, සිය ප්‍රදේශවල විහාරස්ථාන ප්‍රතිසංස්කරණට ද මූලිකත්වය ගනු ලැබුවේ ඔවුන් ය.

කැරැල්ලෙන් පසු ප්‍රතිසංස්කරණය කළ මුප්පනේ රජමහ විහාරය සඳහා අනුග්‍රහය දැක්වූයේ ප්‍රදේශයේ නව රටේරාලවරයා ය. මුප්පනේ ඊට පෙර සිටි රටේරාල කැරැල්ලේදී ජීවිතක්ෂයට පත්විය. බුද්දම විහාරය ප්‍රතිසංස්කරණය සඳහා එවැනි දේශීය නිලධාරීන් තිදෙනෙකුගේ සහාය ලැබුණු අතර, ඔවුන් තිදෙනාගේ සිතුවම් අදාල තනතුරු නාමය ද සමග විහාර බිත්තියේ ඇඳ තිබේ. එවැනි නිලධාරීන් දෙදෙනෙකු කොකුන්නෑව විහාරයේ ඇඳ ඇත්තේ නම් ගම් රහිතව ය. වත්තේගම විහාර බිත්තියේ අනුග්‍රාහක දායකයන් තිදෙනෙකු ඇඳ ඇති අතර, ඔවුන් ආණ්ඩුවේ දේශීය නිලධාරීන් බව ලියා ඇති සටහන්වලින් හඳුනාගත හැකි ය.

මෙම නිලධාරීන්ගේ ආගමික කටයුතු සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ඔවුන් දැරූ තනතුරු බාධාවක්වී නොමැති අතර, සැබවින් ම එකී තනතුරු අනුග්‍රහය සඳහා ආධාරවී ඇති බව පෙනී යයි. කැරැල්ලෙන් පසු වෙල්ලස්ස ප්‍රදේශයේ දේශීය නිල තන්ත්‍රය උඩරට රාජධානියේ අනෙකුත් ප්‍රදේශවල දී මෙන් ම ආගමික





ඡායාරූපය 5. වර්ෂ 1880 - 1910 කාල පරිච්ඡේදය තුළ දී ලෙඩි වර්ණක කට්ටලයක් භාවිතකර ඇති බස්නාහිර වෙරළ තීරයේ කළුතර අශෝකාරාම විහාරස්ථානයේ මානවරූප නිරූපණය කර ඇති ආකාරය

ඡායාරූපය 6. වෙල්ලස්ස තිබිරිය විහාරයේ මානවරූප

ස්ථාන, දේශීය වැසියන්, බ්‍රිතාන්‍ය ආණ්ඩුව යන ත්‍රිත්වය සමඟ සමබර සම්බන්ධතාවයක් පැවැත්වූ බව මැනවින් පෙනී යයි. කැරැල්ලට සම්බන්ධ ඇතැම් ප්‍රභූ නායකයන් ද නඩු විභාගයේ දී රජයේ සාක්ෂිකරුවන් වූයෙන් නැවත සමාජයට එක් වූයේ ප්‍රභූත්වය ආරක්ෂා කර ගනිමිනි. කැරැල්ල පිළිබඳ මතකයන් කෙටිකලකින් සමනයවූ බව පෙනීයන පරිදි බ්‍රිතාන්‍ය රජය ද අඩු වැදගත්කමකින් යුතුවූ කැරලි නායකයන්ට නිදහස ලබාදෙන ලදී (විමලානන්ද, 2019).

ඉහත තත්ත්වය යටතේ ප්‍රතිසංස්කරණයට ලක්වූ වෙල්ලස්සේ විහාර සිතුවම් සඳහා යොදා ගෙන ඇත්තේ රටේ අනෙකුත් ප්‍රදේශවල ද පොදුවේ එම අවධියේ යොදාගත් වර්ණකයන් ම ය. කන්ද උඩරට රාජධානියට අයත්ව තිබූ අන් ප්‍රදේශ හා වෙල්ලස්ස ප්‍රදේශය අතර මෙම අවධියේ දී සුවිශේෂී වෙනස්කමක් විහාර සිතුවම් වර්ණකයන්ගෙන් ද නොපෙනෙන අතර සමාජ ආර්ථික පසුබිම තුළද එවැනි සුවිශේෂී වෙනස්කම් දැකිය හැකි බවක් පෙනීයන්නේ නැත.

## 4.3. බ්‍රිතාන්‍ය පාලනයේ පසු අවධියේ දී වෙල්ලස්සේ සමාජ ආර්ථිකත්වය

බ්‍රිතාන්‍ය පාලනයේ පසු අවධිය මුළුමනින් ම වැවිලි ආර්ථිකය මත සකස්වූවක් විය. මුල් අවධියේ බ්‍රිතාන්‍යයෙන් පැමිණි සිවිල් නිලධාරීන් හා යුධ නිලධාරීන් හැරුණුකොට විශාල වැවිලිකරුවන් ප්‍රමාණයක් දිවයින තුළ ආයෝජන ආරම්භ කිරීමත්, ඔවුන්ගේ අනුකරණයෙන් ශ්‍රී ලාංකිකයන් වැවිලි ව්‍යාපාරවලට යොමුවීමත්, මෙම අවධියේ කැපී පෙනෙන ලක්ෂණයකි (Jayawardena 2000). මුල් අවධියේ දිවයින තුළින් ලාභ උත්පාදනය සඳහා බ්‍රිතාන්‍යයන් උත්සුකවූයේ කුරුඳු ව්‍යාපාරය හරහා ය. නමුත් එය කිසිසේත් ම යටත් විජිතයේ වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් නොවන බව දුටු යටත් විජිත අධිකාරිය ශ්‍රී ලංකාව ව්‍යාපාරික වගාව සඳහා යොමු කරවන්නට විය. නව ආර්ථික වෙනස සඳහා එතෙක් ක්‍රියාත්මක වූ නීතිමය කාරණාවන් මුළුමනින් වෙනස්කිරීම අවශ්‍ය විය. ඕනෑ ම පුරවැසියකුට දිවයිනේ ඕනෑ ම ප්‍රදේශයක වාසය කිරීමේ අවසරය,


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

රාජකාරී ක්‍රමය අහෝසි කිරීම, ශ්‍රමය විකුණා මුදල් ලබාගත හැකි තත්ත්වයක් ඇති කිරීම, රජයේ ඉඩම් ව්‍යාපාරිකයන් සඳහා වැවිලි වගාවට ලබාදීම, පවරා ගතහැකි සියලු ඉඩම් රජයට පවරා ගැනීම වැනි කරුණු කෝල්බෲක් යෝජනාවලිය සමගම ක්‍රියාත්මකවූයේ ඉහත ආර්ථික වෙනස ඉලක්ක කොටගනිමිනි (Jayawardena 2000). මෙම නීතිරීති සමගම එතෙක් පුද්ගලයන් පදිංචි නොවූ හා පරිහරණය නොකරන ලද ඉඩම් විශාල ප්‍රමාණයක් රජයට අයත් වූයෙන් ඒවා වැවිලි ව්‍යාපාර සඳහා විදේශීය මෙන් ම දේශීය කණ්ඩායම් වෙත ද ලබා දුනි. මුල් ම වගාවවූයේ කෝපි වගාවයි. ක්‍රමයෙන් ව්‍යාපාර වෙත යොමුවූ දිවයිනේ දකුණු බස්නාහිර වෙරළ තීරයේ ඇතැම් පිරිස් අරක්කු ව්‍යාපාරය හා මිනිරන් කර්මාන්තය හරහා මුදල් උපයා ගත් අතර, එලෙස ඉපයූ ධනය ද ව්‍යාපාරික වගාවට යොදවන්නට විය (Jayawardena 2000).





ඡායාරූපය 7. වෙල්ලස්ස මුප්පනේ විහාරයේ හස්ති රූප (ඉහල)
ඡායාරූපය 8. වෙල්ලස්ස මයුරගිරි විහාරයේ හස්ති රූප (පහළ)

ව්‍යාපාරික කටයුතුවලින් මුදල් ඉපැයූ පවුල්වල දරුවන් දේශීය අධ්‍යාපන ආයතනවල මෙන් ම එංගලන්තයේ විශ්ව විද්‍යාලවල පවා අධ්‍යාපනයට යොමු කරවීම ද බ්‍රිතාන්‍ය පාලනයේ අවසානයේ සිදු වූ ක්‍රියාවකි. මුදල් සහිත, උගත් ජනකොටසක් ලංකාව තුළ බිහිවීම එහි ප්‍රතිඵලයකි. එම පුද්ගල කණ්ඩායම විසින් දිවයිනේ ආරම්භ කළ විවිධ සමාජ සේවා කටයුතු යටත් විජිතයේ අවසාන අවධියේ දී වැදගත් ලක්ෂණයකි. එය අවසානයේ විවිධ දේශපාලන ව්‍යාපාර දක්වාම නැගී සිටි අතර එකී සමාජ සේවා කටයුතු ආගමික අංශය කරා ද යොමු වූ බව පෙනී යයි. උඩරට හා පහතරට ප්‍රදේශවල ව්‍යාපාරවල නියැලුණු දේශීය ධනපතියන් විහාර ආරාම සඳහා අනුග්‍රාහකයන් බවට පත්වූ අතර එතෙක් නොලැබුණු ආකාර අනුග්‍රහයන් බෞද්ධ විහාරවලට ලැබීමෙන් නවීන ද්‍රව්‍යයන් හා අංගෝපාංග ආරාමික ජීවිතය සමඟ බද්ධ වූ ලක්ෂණ එම අවධියේ දී පෙනී යයි (තන්තිලගේ ඇතුළු පිරිස 2018, 2022).

දිවයිනේ විවිධ ප්‍රදේශවල ඉහත ආර්ථික විපරිණාමය විවිධාකාරයෙන් සිදු විය. මෙම ආර්ථික විපරිණාමීය ක්‍රියාවලිය සමග අත්වැල් බැඳගත් පුරෝගාමී කණ්ඩායම දිවයිනේ දකුණු -බස්නාහිර වෙරළ තීරුව ආසන්නයෙන් බිහිවූ අතර නව ආර්ථික ක්‍රියාවලියේ ද්‍රව්‍යාත්මක අවශේෂයන් මුලින් ම හඳුනාගත හැක්කේ දකුණු පළාත තුළ සහ බස්නාහිර පළාත තුළය. ඉන්පසු කෝපි හා තේ වගාව හරහා එය සබරගමුව පලාතට ද මධ්‍යම පළාතට ගලා ගියේ ය. තේ වගාව ඌව පලාතේ බදුල්ල දිස්ත්‍රික්කයට ද පැතිරුණු නිසාවෙන් උඩරට රාජධානියට අයත්ව තිබූ ඌව මහ දිසාවනි ප්‍රදේශය ද එකී ආර්ථික විපරිණාමයට ලක්විය.

එනමුදු මුදල් සංසරිත නව ව්‍යාපාරික අර්ථ ක්‍රමයේ එලනොලත් ප්‍රදේශ කිහිපයක් ම දිවයින තුළ ඉතිරිවිය. නුවර කලාවිය, තමන්කඩුව, උතුර හා නැගෙනහිර පළාත් මෙන් ම වෙල්ලස්ස ද එකී ප්‍රදේශ අතරට ගැනෙයි. 1880 - 1910 කාලවකවානුවේ දිවයිනේ අන් බොහෝ ප්‍රදේශ නව අර්ථ ක්‍රමයකට පිවිසෙද්දී නුවර කලාවිය, තමන්කඩුව, වෙල්ලස්ස ප්‍රදේශ කරා එම පරිවර්තනය ගලා නොගිය හේතුව ද, ඉන් ජනිත වූ තත්ත්වයන් ද වෙල්ලස්ස කලාපය පදනම් කරගනිමින් තේරුම් ගත හැකි ය. බ්‍රිතාන්‍යයන් යටත් විජිතයෙන් උපරිම ආදායමක් ඉපැයිය යුතු නිසා ව්‍යාපාරික වගාව සිදුකළ හැකි සෑම ප්‍රදේශයක් ම ඒ සඳහා යොදා


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk



ඡායාරූපය 9. වෙ බස්නාහිර වෙරළ තීරයේ කළුතර අශෝකාරාම විහාරයේ හස්ති රූප දැක්වෙන ආකාරය

ගැනීමට උත්සුක විය. ඒ යටතේ වෙල්ලස්ස ප්‍රදේශයේ තේ වගාව සිදුකිරීම සඳහා උත්සාහයක් දරන ලදී. 1900 වසරේ දී මරගල කඳුවැටිය ආශ්‍රිතව අක්කර 288ක තේ වගාවක් ආරම්භ කළමුත්, එය වර්ධනය වීමක් නොවී කෙටි කාලයකින් අතහැර දැමීමට සිදුවිය (ජිවුලෙහෙල, 2018: 362-370). ඉන් බොහෝ කලකට පසුව රබර් වගාව ආරම්භ කරන තෙක්ම යටත් විජිත අවධියේ දී මොණරාගල දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරික වැවිලි වගාවන් සිදුවුයේ නැත. එම තත්වය යටතේ ධනපති පංතියක් හෝ මුදල් උපයන කම්කරු පංතියක් වෙල්ලස්ස කලාපයේ ඇතිවූයේ නැත. එම නිසා බැහැරින් සිදුවූ විශාල පරිමාණ පුද්ගල සංක්‍රමණයන් ද එම ප්‍රදේශයට සිදුවූයේ නැත. එබැවින් යටත් විජිත අවසාන අවධිය තුළ වෙල්ලස්ස නිෂ්පාදන ප්‍රදේශයක් තබා හොඳ ඉලක්ක වෙළඳපොලක් ලෙස ද නොසැලකිනි. එබැවින් එහි කුඩා වැව් ආශ්‍රිතව වී වගාව සිදුවූ වැව් ගම්මානත් හේන් වගාව සිදුවූ ගම්මානත් පමණක් ඉතිරිව බොහෝ ප්‍රදේශ වනගහනයට නතුව පැවතිණි. අගනුවරින් බොහෝ දුර බැහැර පිහිටි මෙම ප්‍රදේශය බ්‍රිතාන්‍ය ආණ්ඩුවට ලාභදායී ප්‍රදේශයක් නොවීමෙන් එහි යටිතල පහසුකම් සංවර්ධනය ද අවම මට්ටමක විය. මාර්ග පද්ධතිය වැඩි දියුණු නොවීමෙන් ප්‍රවාහන කටයුතුවල දුෂ්කරතාව නිසා ප්‍රදේශය ස්වභාවිකව හුදෙකලා තත්ත්වයකට ලක් විය.

වෙල්ලස්ස තුල ස්වයංපෝෂී තත්ත්වයට ආසන්න ගම්මානවල ජීවත්වූ ගැමියන්ගේ ජනගහනය අවමවීම මෙන්ම අවශ්‍යතා සරල වීමෙන් ඔවුන් අතරින් වෙළෙඳපොළක් බිහි නොවීම හේතුවෙන් භාණ්ඩ අලෙවිය ද අන් ප්‍රදේශවල මෙන් ලාබදායී තත්ත්වයක් නොවීය. එබැවින් කුඩා සිල්ලර ව්‍යාපාරිකයන් එදිනෙදා අවශ්‍ය ද්‍රව්‍ය වෙල්ලස්ස තුළට ලබාදෙන ලදී ඇතැම් විට නැගෙනහිර පළාතේ මුස්ලිම් ව්‍යාපාරිකයන් ද, දකුණු පළාතේ සිංහල ව්‍යාපාරිකයන් ද, වෙල්ලස්ස තුළ සිල්ලර ව්‍යාපාරවල නිරතවන ලදී. දිවයිනේ අන් ප්‍රදේශවල පුද්ගලයන් එම අවධියේ දී වෙල්ලස්ස හැඳින්වූයේ සිංහලේ යන නමිනි. එක් කලක 'සිංහලේ' සිල්ලර ව්‍යාපාර ගාල්ල-මාතර ප්‍රදේශවල කුඩා ව්‍යාපාරිකයන්ගේ අත ම පැවතුණු ව්‍යාපාරයක් විය.

මෙවැනි පසුබිමක් තුළ වෙල්ලස්ස කලාපයේ විහාර සිතුවම්කරණය සඳහා 1880 - 1910 අවධියේදී අනුග්‍රහය දැක්විය හැකි නව ව්‍යාපාරික පන්තියක් නොමැතිවීම වටහා ගත හැකි තත්වයකි. එම අවධියේ දී දිවයිනේ අන් ප්‍රදේශවල ලෙඩ් වර්ණක භාවිතකර නව ශෛලියකින් සිතුවම් අඳිනු ලැබූ විහාරස්ථාන වෙත අනුග්‍රහය දැක්වූයේ එකී ප්‍රදේශයන්හි පදනම්වූ නව ව්‍යාපාරික පැලැන්තියකි. එම ව්‍යාපාරික ප්‍රභූ පවුල් බ්‍රිතාන්‍ය ආයතන වෙත මෙන් ම, බ්‍රිතාන්‍ය අධ්‍යාපනය සඳහා ද නැඹුරුව සහිත ඉංග්‍රීසි උගත් පමණක් නොව එදිනෙදා ජීවිතයේදී ඉංග්‍රීසිය බැවහරණ කණ්ඩායමක් ද විය. නමුත් වෙල්ලස්ස තුළ වතු වගාව හෝ මිනිරන් කර්මාන්තය වැනි තත්කාලීන සමාජයේ ධනෝපායන මාර්ග අවම වීමෙන් එවැනි ධනපති පංතියක බිහිවීම සිදු නොවීමෙන් 1880 - 1910 කාලවකවානුවේ නවීන වර්ණක භාවිතය හෝ සංක්‍රාන්ති සිතුවම් ඇන්දවීම ද සිදුවූ බවක් නොපෙනේ.

## 5. සමාලෝචනය

මහනුවර අවධියේ සිතුවම්වල වර්ණක විශ්ලේෂණයන් මගින් පෙනී යන්නේ ඒවායේ අවධි තුනක දී එකිනෙකට වෙනස් වර්ණක භාවිතා කර ඇති බව යි. ඉන් ප්‍රථම වර්ණක කට්ටලය වන සාදිලිංගම් සහ ගොකටු මහනුවර සිතුවම්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සම්ප්‍රදායේ වර්ධනීය ම අවධිය ලෙස සැලකිය හැකි කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවදියේ දී භාවිතා කර ඇත. වෙල්ලස්ස කලාපය තුළ ද මහනුවර සිතුවම් ශෛලිය එකී අවධියේ දී ආරම්භ වූ අතර, සාදිලිංගම් සහ ගොකටු වර්ණක ඒ සඳහා භාවිතා කර ඇත. ඉන් පසුව බ්‍රිතාන්‍ය පාලනය සමයේ 1830 - 1840 අවධිවල මහනුවර සිතුවම් සඳහා සාදිලිංගම් සහ ඔපිමන්ට් භාවිතා කර ඇත. වෙල්ලස්සේ සිතුවම්වල ද එකී වර්ණක එම ආකාරයෙන් ම භාවිතව තිබෙනු දැකිය හැකි ය. දිවයිනේ අන් ප්‍රදේශවල 1880 - 1910 කාලසීමාවේදී සංක්‍රාන්ති සිතුවම් ශෛලිය පැතිර ගිය අතර, ඒ සඳහා ලෙඩ් ඔක්සයිඩ්, ලෙඩ් ක්‍රෝමේට්, ප්‍රසියන් නිල භාවිත කර ඇත. මෙම අවධියේදී ඉතා ම ලාභදායි ප්‍රසියන් නිල යොදා වෙල්ලස්ස සිතුවම් ප්‍රතිසංස්කරණයකර ඇති නමුත් සංක්‍රාන්ති සිතුවම් ආරත්, ලෙඩ් ඔක්සයිඩ්, ලෙඩ් ක්‍රෝමේට් වර්ණකත් එහි භාවිතව නොමැත. එකී සිතුවම් ආරත්, වර්ණ කට්ටලයත් භාවිතව ඇත්තේ දිවයිනේ වර්ධනයවූ නව ධනපති පන්තියකගේ අනුග්‍රහය ලත් විහාර සිතුවම්වල ය. එනමුදු වෙල්ලස්ස කලාපය තුළ එවැනි ධනපති පන්තියක් බිහිවී නොමැත. යටත්විජිත සමයේ අවසාන භාගයේ දී එවැනි පන්තියක බිහිවීම සඳහා සමාජ ආර්ථික සාධකයන් වෙල්ලස්ස තුළ නිර්මාණය වී නොමැත. විහාර සිතුවම්වල වර්ණක විශ්ලේෂණය මගින් කන්ද උඩරට රාජධානි සමයේ සිට යටත්විජිත අවසාන අවධිය දක්වා වෙල්ලස්ස කලාපයේ සමාජ, ආර්ථික පසුබිම පිළිබඳව මෙවැනි ප්‍රක්ෂේපනයක් යෝජනා කර සිටිය හැකිය.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ


– කරුණාතිලක, එන්.ටී., 1989. *දැදුරු ඔය අසබඩ විත්ති*, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.

– ජිවුලෙහෙල, එන්. (සංස්.) 2018. මරගල කඳුවැටිය. *වෙල්ලස්සේ අභිමානය*. බදුල්ල, ඌව පළාත් සභාව.

– තන්තිලගේ, ඒ. ඇතුළු පිරිස, 2018 *දහනවවන සියවසේ සංක්‍රාන්තීය සිතුවම් ශිල්පීන්ගේ වර්ණක කට්ටලයේ සංක්‍රාන්තිය*, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ.

– තන්තිලගේ, ඒ. ඇතුළු පිරිස, (සංස්.) 2022 *මහනුවර යුගයේ බිතු සිතුවම්වල වර්ණක භාවිතයේ අවකාශීය හා කාලානුක්‍රමාවලියේ විෂමතාව*, මහාචාර්ය ටී.ජී. කුලතුංග අභිස්තව ග්‍රන්ථය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

– ප්‍රසංග, එස්., (සංස්.) 2018. මහබල දිසාව. *වෙල්ලස්සේ අභිමානය*. බදුල්ල, ඌව පළාත් සභාව.

– බණ්ඩා ජී., (සංස්.) 2018. වෙල්ලස්සේ විමුක්ති සටන. *වෙල්ලස්සේ අභිමානය*. බදුල්ල, ඌව පළාත් සභාව.

– බණ්ඩාර, එස්. (සංස්.) 2018. වෙල්ලස්සේ කැරැල්ල නිසා පසුකාලීනව අධ්‍යාපනයට සිදුවූ බලපෑම. *වෙල්ලස්සේ අභිමානය*. බදුල්ල, ඌව පළාත් සභාව.

– මහින්ද හිමි, යූ. (සංස්.) 2018. ඌවේ විහාරවල දක්නට ලැබෙන මහනුවර සම්ප්‍රධායේ බිතු සිතුවම්. *වෙල්ලස්සේ අභිමානය*. බදුල්ල, ඌව පළාත් සභාව.

– රතනජෝති හිමි, එල්., (සංස්.) 2018. ඌව වෙල්ලස්ස දේශපාලන පසුබිම. *වෙල්ලස්සේ අභිමානය*. බදුල්ල, ඌව පළාත් සභාව.

– සුමනසාර හිමි, එල්., (සංස්.) 2018. වෙල්ලස්සේ සඟ පරපුර. *වෙල්ලස්සේ අභිමානය*. බදුල්ල, ඌව පළාත් සභාව.

– විමලානන්ද, ටී., 2019. *උඩරට මහ කැරැල්ල*, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.

– Gunasinghe, S., 1978. *An Album of Buddhist paintings from Sri Lanka*, Colombo, National Meusem of Sri Lanka.

– Jayawardena K., 2000. *Nobodies to Somebodies The rise of colonial bourgeois in Sri Lanka*, Sanjive books, Colombo.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk